# G.C.E. ORDINARY LEVEL

## අ.පො.ස. සාමාන්‍ය පෙළ

**STUDENT SEMINAR SERIES - 2017**

**ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017**

# GEOGRAPHY

## භූගෝල විද්‍යාව

# QUESTION PAPER - I

## ප්‍රශ්න පත්‍රය - I




**Powered by**

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව TM — The National e-learning Portal for The General Education

සා/පෙළ සිත්මිණ

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ඉ-ඉගෙනුම් හා නැණස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**
**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය**
**උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017**

# භූගෝල විද්‍යාව - I පත්‍රය

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ. 1 |
|---|---|---|

- අංක 01 සිට 40 දක්වා සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට එක ලකුණ බැගින් මුළු ලකුණු 40 කි.
- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහනෙන් තෝරා තිත් ඉර මත ලියන්න.

1) පෘථිවි කබොල සහ ඉහළ ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ......................................ලෙස හැඳින්වේ.

( ශිලා ගෝලය / ජල ගෝලය / වායු ගෝලය )

2) ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උයනක් පිහිටි ස්ථානය වන්නේ ....................................................... යි.

( අම්බලන්තොට / බටඅත / මහ ඉලුප්පල්ලම )

3) විපරීත පාෂාණයක් වන ....................................................... පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගනියි.

( කිරිගරුඬ / මිනිරන් / පොස්පේට් )

4) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වී ඇති තත්වයෙන් උසස් ම යපස් වර්ගය ............................................................. වේ.

( මැග්නටයිට් / ලිමොනයිට් / හෙමටයිට් )

5) රතු දුඹුරු ලැටසෝල් පස ........................................................... කලාපයේ ව්‍යාප්ත වී ඇත.

( තෙත් / වියළි / අතරමැදි )

6) ලොව ජනතාවගෙන් බහුතරයක් පරිභෝජනයට ගන්නා ධාන්‍ය වර්ගය .......................ය.

( වී / ඕට්ස් /තිරිඟු )

7) ශ්‍රී ලංකාවේ අතරමැදි කලාපය ආශ්‍රිතව වී වගා කරන දිස්ත්‍රික්කයක් ලෙස....................................වැදගත් වේ.

( මහනුවර / අනුරාධපුරය / කුරුණෑගල )

8) රටක වැඩිහිටි යැපෙන්නන් සංඛ්‍යාව වැඩි වීම ජන සංඛ්‍යාව ................................................ ලෙස හඳුන්වයි.

( වියපත් වීම / ප්‍රසාරණය / හායනය )

9) සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය හේතුවෙන් ................................................ දූපත නිර්මාණය වී ඇත.

( බෝර්නියෝ / හවායි / මැඩගස්කරය )

10) 1:50000 භූ ලක්ෂණ සිතියම්වල එක් සෙන්ටි මීටරයකින් සැබෑ භූමියේ ..................................ක දුරක් නිරූපණය කෙරේ.

( කිලෝමීටර 1 / කිලෝමීටර 2 / කිලෝමීටර 0.5 )

- ප්‍රශ්න අංක 11 සිට 17 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11) නැගෙනහිර ආසියාතික වෙරළට ඔබ්බෙන් පැසිපික් සාගරයේ හට ගන්නා සුළි සුළං 'ටයිෆුන්' ලෙස හඳුන්වයි ( නි / වැ )

12) සාර්ක් රටවල්වල ජන සංඛ්‍යා ව්‍යාප්තියෙන් 77.3% නාගරික ප්‍රදේශවල වාසය කරයි. ( නි / වැ )

13) රිච්ටර් පරිමාණය පදනම් කරගෙන සුළි සුළඟක තීව්‍රතාව මැන බලයි. ( නි / වැ )

14) කටු පඳුරු හා ලඳු කැලෑ ව්‍යාප්ත ව ඇත්තේ සෙල්සියස් අංශක 27 ට වඩා වැඩි උෂ්ණත්වයක් ඇති ප්‍රදේශවල ය. ( නි / වැ )

15) ශ්‍රී ලංකාව අයත් වන්නේ ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටියට යි ( නි / වැ )

16) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම ලෝක කෘෂි කර්මාන්තය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. ( නි / වැ )

17) මෝටර් රථ කර්මාන්තයේ පෙරමුණේ ම සිටින රට ඇමරිකා එක්සත් ජනපදය යි. ( නි / වැ )

- ප්‍රශ්න අංක 18 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීර දෙකක් දැක්වේ.

18) ශ්‍රී ලංකාවේ සංචාරක කලාප කිහිපයක් 'අ' තීරයේ ද, එම කලාපයන්හි පිහිටි නගර 'ආ' තීරයේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න

| අ | ආ |
|---|---|
| 1. මහ කොළඹ කලාපය | A - කුරුණෑගල |
| 2. පුරාණ නගර | B - මාරවිල |
| 3. නැගෙනහිර වෙරළ | C - රත්නපුරය |
| 4. මධ්‍යම කඳුකරය | D - කතරගම |
| | E - මඩකලපුව |

1) AEBC 2) BAEC 3) CAEB 4) EABC

19) ලෝකයේ ප්‍රධාන කර්මාන්ත කිහිපයක් 'අ' තීරයේ ද, ඒවායේ නිෂ්පාදන භාණ්ඩ කිහිපයක් 'ආ' තීරයේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න

| අ | ආ |
|---|---|
| 1. විද්‍යුත් කර්මාන්තය | A පිත්තල භාණ්ඩ |
| 2. පෙට්‍රෝ රසායන කර්මාන්ත | B ජල බෝතල් |
| 3. ගෘහ කර්මාන්තය | C ජංගම දුරකථන |
| 4. ආහාරපාන කර්මාන්තය | D බෝට්ටු නිෂ්පාදනය |
| | E ඖෂධ වර්ග |

1) ADCE  2) EABC  3) BCEA  4) CEAB

20) ලෝකයේ මහාද්වීප කිහිපයක් 'අ' තීරයේ ද, එම මහාද්වීපවලට අයත් විල් 'ආ' තීරයේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න

| අ | ආ |
|---|---|
| 1. ආසියා මහාද්වීපය | A - ටිටිකාකා |
| 2. දකුණු ඇමරිකා මහාද්වීපය | B - ලැඩෝගා |
| 3. යුරෝපා මහාද්වීපය | C - බෝල්කෑෂ් |
| 4. ඕස්ට්‍රේලියා මහාද්වීපය | D - මිචිගන් |
| | E - අයර් |

1) BAEC  2) CABE  3) CEAB  4) EABC

➢ ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න

21) විද්‍යාත්මක හා පර්යේෂණ කටයුතු සඳහා පමණක් ඇතුළු වීමට මහජනතාවට අවසර ලබා දී ඇති වනජීවී රක්ෂිත වර්ගය ............................................... නමින් හැඳින්වේ.

22) අප්‍රිකා මහාද්වීපයේ ජනාධික ම රට ...................................................................... වේ.


23) පෘථිවි පෘෂ්ඨයේ සිට කිලෝමීටර 8 සිට 12 පමණ දක්වා උසක විහිදෙන වායුගෝලීය ස්තරය

................................................ නමින් හැඳින්වේ.

24) සිතියමක ඇතුළත් තොරතුරු කියවීම සඳහා ............................................ අවශ්‍ය වේ.

25) ශ්‍රී ලංකාවේ මයික්‍රෝ වාහන එකලස් කිරීමේ ප්‍රධාන කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ ..................ප්‍රදේශයේ ය.

- 26 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න





26) ශ්‍රී ලංකාවේ නිවර්තන වැසි වනාන්තරයක් වන කන්නෙලිය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂර...................... ය.

27) ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් බෝ කරන මධ්‍යස්ථානයක් වන පදවිය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය........... ය.

28) ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථානයක් වන ආරුගම් බොක්ක පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය ................. ය.

- පහත දැක්වෙන්නේ 2006 - 2011 ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ තොරතුරු දැක්වෙන ප්‍රස්තාරයකි. එය අධ්‍යයනය කර පහත දැක්වෙන 29, 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න



29) සංචාරකයින්ගේ පැමිණීම අඩු ම වර්ෂය කුමක් ද ? ............................

30) ප්‍රස්තාරයට අනුව සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් ඇති කාල සීමාව ලියා දක්වන්න ..........................

➢ ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න

31) පහත දැක්වෙන ස්වාභාවික සම්පත් අතරින් පුනර්ජනනීය සම්පත් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න,

1. ජලය, පස, පාෂාණ
2. වනාන්තර, පස, වන ජීවීන්
3. පොසිල ඉන්ධන, පස, ජලය
4. වාතය, ජලය, පස (.............)

32) තෙත් කලාපීය කඳුකර ප්‍රදේශවල ඉදිකර ඇති ජලාශ ඇතුළත් පිළිතුර තෝරන්න

1. යෝධ වැව, රන්ටැඹේ
2. කොත්මලේ, යෝධ වැව
3. කොත්මලේ, රන්දෙනිගල
4. කොත්මලේ, කවුඩුල්ල (.............)

33) ගංගා මෝය, කලපු සහ වැව් වැනි තැන්වල ව්‍යාප්ත ව ඇති වනාන්තර වර්ගය වන්නේ,

1. සදාහරිත වනාන්තර
2. කටු පඳුරු හා ලඳු කැළෑ
3. කඩොලාන
4. පතනශීල වනාන්තර (.............)

34) ජාතික උද්‍යාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න

1. වස්ගමුව, සිංහරාජය
2. වික්ටෝරියා, රන්දෙනිගල
3. කන්නෙලිය, දෙදියගල
4. වස්ගමුව, ලුණුගම්වෙහෙර (.............)

35) දකුණු ආසියානු කලාපයේ ජන ඝනත්වය වැඩි ම රට කුමක් ද ?

1. භූතානය 2. මාලදිවයින 3. ඉන්දියාව 4. බංග්ලාදේශය (.............)

36) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ සුවිශේෂී ලක්ෂණයක් **<u>නොවන්නේ</u>** මින් කුමක් ද ?

1. වැඩිමහලු යැපෙන්නන් සංඛ්‍යාව වැඩිවීම
2. උපත් අනුපාතිකය ක්‍රමයෙන් අඩු වීම
3. ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය ඉහළ යාම
4. බාල වයස් සංඛ්‍යාව ඉහළ යාම (.............)

37) තොරතුරු සන්නිවේදන තාක්ෂණය දියුණු වීම රටේ සංවර්ධනයට බාධාකාරී වන කරුණ කුමක් ද ?

1. අධ්‍යාපන සංවර්ධනයට උපකාරි වේ
2. ආපදා අවස්ථාවල කඩිනමින් දායක වීමට හැකි වීම
3. මුල්‍යමය වංචනික ක්‍රියා සිදුවිය හැකි ය
4. සන්නිවේදනයේ කාර්යක්ෂමතාව වැඩි කර ගත හැක (........)

38) කිරි ගව සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ස්ථානයකි,

1. අඹේවෙල 2. කනන්විල 3. වල්පිට 4. මීවනපලාන (.............)

39) මිරිදිය මසුන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. කාවයියා, සූඩයා, කනයා 2. ඇටවල්ලා, අලගුඩුවා, ලූලා
3. මස්පෙතියා, කාවයියා, ගොඩයා 4. හුංගා, කනයා, සාලයා (.............)

40) ශ්‍රී ලංකාවේ බුලත් වගාව සඳහා පිහිටුවා ඇති අපනයන ගම්මානය පිහිටුවා ඇත්තේ,

1. දඹදෙණිය 2. රාජාංගනය 3. පොළොන්නරුව 4. කටුගම්පොල (.............)

*******


ඉන්ටනෙට් සෙල්ලං
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි